ස්වදේශ කටයුතු චක්‍රලේඛ : 03/2015

මගේ අංකය:HAF-1/02/REP/2015

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07.

2015.05. 18

අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

## ජන රජ දිනය සැමරීම

1948 පෙබරවාරි 04 දින සිට ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් මිදුනද තවදුරටත් බ්‍රිතාන්‍ය රජුගේ කිරීටය යටතේ ඩොමීනියන් තත්වයේ නිදහසක් පමණක් හිමිව තිබුණි. එහෙත් 1972 ජනරජ ව්‍යවස්ථාවත් සමඟ ශ්‍රී ලංකාව, ජනතාවට වගකියන සම්පූර්ණයෙන් ස්වෛරී සහ නිදහස් රාජ්‍යයක් බවට පත්විය. ඒ අනුව, අංක 08/0562/325/004 හා 2008.04.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, සෑම වසරකම මැයි මස 22 වන දින, සියලුම රාජ්‍ය ආයතන "ජන රජ දිනය" සැමරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු අතර, අංක 15/0581/607/017 හා 2015.05.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් මෙම වසරේ ද මැයි මස 22 වන දින ඔබ කාර්යාලයේ / ආයතනයේ ජනරජ දිනය සැමරීමේ වැඩසටහනක් සකස් කොට ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි.

01. පෙ.ව.8.30 ට ජාතික කොඩිය ඔසවා උත්සවය ආරම්භ කිරීම

02. ආයතන ප්‍රධානියා හෝ ඔහුගේ නියෝජිතයකු විසින් තම කාර්යය මණ්ඩලය අමතා පහත කරුණු පිළිබඳව සැලකිලිමත් වෙමින් ජනරජ දිනය සැමරීමේ වැදගත්කම අවධාරණය කරමින් විනාඩි 15 ක පමණ කතාවක් කිරීම.

- 1972 ජනරජ ව්‍යවස්ථා කෙටුම්පත ජාතික රාජ්‍ය සභාව විසින් සකස් කිරීම
- මේ සම්බන්ධයෙන් මූලිකත්වය ගත් නායකයන්ගේ දායකත්වය ඇගයීම.
- ජනරජ ව්‍යවස්ථාවත් සමගම ශ්‍රී ලාංකිකයන් බ්‍රිතාන්‍ය පාලනයෙන් සම්පූර්ණයෙන් මිදුනු, ස්වෛරී නිදහස් ජාතියක් බවට පත්වීම.
- ජනතාවට වගකියන ජනරජයක් බවට පත්වීම.
- අප රටට ගැලපෙන පරිපාලනමය සහ ආර්ථිකමය වෙනස්කම් සිදු කිරීමට බලකල ලැබීම.

එස්. ඩී. ඒ. බී. බොරලැස්ස

ලේකම්

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය